# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2021 ජූලි මස 30 වන දින

## II වන කොටස

## අතිරේකය

(2021.08.02 දින නිකුත් කරන ලදී)

# යූඑන්වී පදනම (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

**යූඑන්වී පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වේලු කුමාර් මහතා විසින්
පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 18.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## යූඑන්වී පදනම (සංස්ථාගත කිරීමේ)

### යූඑන්වී පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

**පූර්විකාව**

"යූඑන්වී පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව, එකී පදනමට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉටුකිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය**

1. මේ පනත 2021 අංක      දරන යූඑන්වී පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**යූඑන්වී පදනම සංස්ථාගත කිරීම**

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන් පසුව (මෙහි මින්මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) යූඑන්වී පදනමේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් සහ මින්මතු බඳවාගනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාව" වශයෙන් හඳුන්වනු ලබන) "යූඑන්වී පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද සම්පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

**සංස්ථාවේ පොදු පරමාර්ථ**

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ළමුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම;

(ආ) ජාතීන් අතර සාමය වර්ධනය කිරීම;

(ඇ) රටේ සංවර්ධනයට සහභාගි වීම;

(ඈ) ශ්‍රී ලංකාව තුළ ජීවත්වන සියලුම ජාතීන්ට සමගියෙන් හා සහජීවනයෙන් ජීවත් වීමට අවශ්‍ය උපදෙස් සහ ආධාර ලබා දීම;

(ඉ) කාන්තාවන්ගේ සමාජයීය, ආර්ථික සහ අධ්‍යාපන දියුණුව සඳහා වෙනම ඒකකයක් පිහිටුවා එය නඩත්තු කිරීම;

(ඊ) ජාති, ආගම්, කුල බේදයෙන් තොරව අධ්‍යාපනික, ආගමික, සංස්කෘතික, කලා හා ක්‍රීඩා පහසුකම් දියුණු කිරීම සඳහා ආධාර උපකාර කිරීම සහ නොයෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික අනාථ නිවාසවලට මුදල් සහ වෙනත් ආධාර ලබාදීම සහ ආහාර සැලසුම් ක්‍රියාත්මක කිරීම;

(උ) මත් උවදුර පැතිරීම නැවැත්වීම හා ඊට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනයට පියවර ගැනීම;

(ඌ) ධීවර හා කෘෂි කර්මාන්තය වැඩි දියුණු කිරීමට ගොවීන්ට හා ධීවරයන්ට අවශ්‍ය උපකරණ සැපයීම;

(එ) ස්වයං රැකියා සඳහා තරුණ තරුණියන් හට මුල්‍ය පහසුකම් ලබා දීම;

(ඒ) විනය හා සංස්කෘතික සාරධර්මයන් ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම; සහ

(ඔ) ඉහත දැක්වෙන පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය සංවිධාන සමඟ සහයෝගීව කටයුතු කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම

4. (1) සංස්ථාවේ කටයුතු මෙම පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ පවත්නා රීතිවලට යටත්ව සහ එම රීතිවලට අනුකූලව තෝරා පත්කරනු ලබන සභාපති, නියෝජ්‍ය

සභාපති, ලේකම්, භාණ්ඩාගාරික සහ තවත් සාමාජිකයින් එකොළොස් දෙනකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) පදනමේ ආරම්භක සාමාජිකයා අධ්‍යක්ෂ මණ්ඩලයේ යාවජීව සභාපතිවරයා විය යුතු අතර, ඉන් අනතුරුව එවකට සභාපතිවරයා ලෙස ධුරය දරන තැනැත්තාගේ ළඟම ඥාතියා, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඊළඟ සභාපතිවරයා විය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුවම වූ දිනයේ දී පදනමේ පාලක මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල

**5.** බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් හා පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද, සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටු කරගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ, සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ රීති

**6.** (1) සංස්ථාව විසින් කලින් කල සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානයන්ට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජික ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, අස් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) සංස්ථාවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එකී රැස්වීම්වල ගණපූරණය ද, ඔවුන්ගේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඈ) සංස්ථාවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වීම සඳහා අවශ්‍ය කරන සුදුසුකම්; සහ

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම්කිසි රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන් ම එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය

7. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවැති පදනමේ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය සහ ගෙවිය යුතු සම්මාදම් මුදල් හෝ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල

8. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් මෙතෙක් භාරගන්නා ලද හෝ මින්මතු භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ, පැවරීම්, පරිත්‍යාග, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් වූ මුදල්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි සංස්ථාවේ නමින් එක බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කළ යුතු ය.

(2) මෙම පනත යටතේ සංස්ථාව සතු බලතල, ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ භාර අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, බද්දට ගැනීමක්, තෑගි ලැබීමක්, කිසියම් ගිවිසුමක් මත හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙහි ලා සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, එම දේපළ සංස්ථාවේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය. තව ද, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාව විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ

**10.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදයමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙද දීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය

**11.** (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වැය කරන ලද සංස්ථාවේ සියලු මුදල් පිළිබඳව ගිණුම නිසි අයුරින් තැබීමට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියා කළ යුතු ය.

(2) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(3) පදනමේ ගිණුම්, සෑම වර්ෂයකම යටත් පිරිසෙයින් එක් වරක් හෝ පරීක්ෂාකොට විගණනය කරනු ලැබිය යුතු අතර, පදනම විසින් පත් කරනු ලබන විගණකවරයෙක් හෝ විගණකයින් විසින් ආදයම් සහ වියදම් පිළිබඳ ගිණුම් සහ ශේෂපත්‍රය සහතික කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව

12. සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් සාමාජිකයකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධනපත්‍රයකට නොතැබිය යුතු යි. තමන් පැමිණ සිටින බවට සළකුණක් වශයෙන් ඔවුන් එකී සාධන පත්‍රයේ තම නම් ලියා අත්සන් කළ යුතු අතර. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවෙක් වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

13. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

14. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.